// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2266/72 - 2022 පෙබරවාරි මස 11 වැනි සිකුරාදා - 2022.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2 වන සංශෝධනය

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2020 ඔක්තෝබර් මස 27 දිනැති අංක 2199/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද, ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 පෙබරවාරි මස 10 වැනි දින.

**I කොටස**

සංශෝධනය 01 - 2021 ඔක්තෝබර් මස 04 දිනැති අංක 2248/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

**II කොටස**

14. ආයුර්වේද වෛද්‍ය සේවයට අන්තර්ග්‍රහණය යටතේ ii හි (ඉ) ලෙස පහත වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

(ඉ) අධි ශ්‍රේණියේ වසර 03 ක් හෝ ඊට වැඩි කාලයක් සේවයේ යෙදී සිටින නිලධාරීන් පරිපාලන I ශ්‍රේණියට ද, අධි ශ්‍රේණියේ වසර 03 කට අඩු කාලයක් සේවයේ යෙදී සිටින නිලධාරීන් පරිපාලන II ශ්‍රේණියට ද අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. අන්තර්කාලීන විධිවිධාන යටතේ පහත වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

15.3 නව සේවා ව්‍යවස්ථාවේ ආයුර්වේද වෛද්‍ය පරිපාලන ශ්‍රේණිවලට නිලධාරීන් අන්තර්ග්‍රහණය කරන තෙක් පූර්ව සේවා ව්‍යවස්ථාව අනුව ආයුර්වේද වෛද්‍ය අධි ශ්‍රේණියට උසස් කර ඇති නිලධාරීන් V පරිශිෂ්ඨයේ සඳහන් ආයුර්වේද වෛද්‍ය පරිපාලන ශ්‍රේණි යටතේ අනුමත තනතුරුවලට පත් කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ලෙස සලකනු ලැබේ. තවද නව සේවා ව්‍යවස්ථාව යටතේ ආයුර්වේද වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ සේවා කාලය ගණනය කිරීමේදී පූර්ව සේවා ව්‍යවස්ථාව අනුව අධි ශ්‍රේණියේ සේවය කර ඇති කාලය ද ඇතුළත්ව ගණනය කරනු ලැබේ.

EOG 02 - 0459

1A - G 36056 — 12 (2022/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*